# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2468/10 - 2025 දෙසැම්බර් මස 23 වැනි අඟහරුවාදා - 2025.12.23**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**නැගෙනහිර පළාතේ පළාත් සභාව**

1990 අංක 28 දරන පළාත් සභා (සංශෝධන) පනතින් සංශෝධිත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32(2) වගන්තිය යටතේ නැගෙනහිර පළාත් රාජ්‍ය සේවය පිළිබඳ බලතල පැවරීම සම්බන්ධයෙන් වූ නියමයයි.

නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවර ජයන්ත ලාල් රත්නසේකර වන මම 1990 අංක 28 දරන පළාත් සභා (සංශෝධන) පනතින් සංශෝධිත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32(1) උප වගන්තිය යටතේ නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ නිලධරයන් බඳවාගැනීම, පත්කිරීම, ස්ථානමාරු කිරීම, උසස් කිරීම, සේවයෙන් පහකිරීම සහ විනය පාලනය සම්බන්ධයෙන් මා වෙත පැවරී ඇති බලතල, උක්ත පළාත් සභා පනතේ 32(2) උප වගන්තිය ප්‍රකාරව අංක 1,2 උපලේඛනයන්හි සහ ඇමුණුම් I,II හි සඳහන් කොන්දේසිවලට යටත්ව නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත 2026 ක් වූ ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙයින් පවරා දෙමි.

විනය බලධාරියාගේ සහ/හෝ නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණයකින් අතෘප්තියට පත් වන නිලධාරියෙකුට නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවරයා වෙත අභියාචනා කිරීමට අයිතිවාසිකම් ඇති බවත් නියම කොට ප්‍රකාශ කරමි.

නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ බලතල පැවරීමට අදාළ 2011.09.08 දිනැති අංක 2011/08 ආණ්ඩුකාර සංදේශය හා ඊට අදාළ පසුකාලීන සංශෝධන, එම නියෝගයන් යටතේ ගන්නා ලද කිසිදු ක්‍රියාමාර්ගයකට අගතියක් නොවන පරිදි වර්ෂ 2026 ජනවාරි පළමුවන දින සිට මෙයින් පරිච්ඡින්න කරන බවද නිවේදනය කරමි.

ආචාර්ය, **ජයන්ත ලාල් රත්නසේකර,**
නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවර.

2025 දෙසැම්බර් මස 22 වැනි දින,
නැගෙනහිර පළාත් ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
ඔර්ස් හිල්,
ත්‍රිකුණාමලය.

**ආණ්ඩුකාර සංදේශ 2026/01**

***නැගෙනහිර පළාත් රාජ්‍ය සේවය පිළිබඳ බලතල පැවරීම***

**උපලේඛන 1**

(1) නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවර ජයන්ත ලාල් රත්නසේකර වන මම වර්ෂ 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32(1) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, වෙනත් ඕනෑම නීතියක විධිවිධානවලට අගතියක් නොවන පරිදි, පහත සඳහන් නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ තනතුරු සම්බන්ධයෙන් පත්කිරීම්/ස්ථානගත කිරීම් හා ස්ථානමාරු කිරීම පිළිබඳ බලතල අදාළ දීප ව්‍යාප්ත සේවාවන්හි සේවා ව්‍යවස්ථාවන්හි විධිවිධානයන්ට අනුව මා විසින් ක්‍රියාත්මක කිරීමට අගතියක් නොවන පරිදි උක්ත පනතේ 32(2) වගන්තිය යටතේ මා වෙත පවරා ඇති බලතල යටතේ නැගෙනහිර පළාතේ පළාත් රාජ්‍ය සේවයෙහි බඳවාගැනීම්, පත්කිරීම්, ස්ථානගත කිරීම්, උසස් කිරීම්, ස්ථානමාරු කිරීම්, විනය පාලනය හා සේවයෙන් පහකිරීම පිළිබඳ බලතල නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (මින් ඉදිරියට PPSC-EP යනුවෙන් හඳුන්වනු ලබන) වෙත මෙමගින් පවරමි. එනම්,

I. නැගෙනහිර පළාත් අමාත්‍යාංශවල ලේකම්වරුන්
II. නැගෙනහිර පළාත් ආණ්ඩුකාර ලේකම්
III. නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්
IV. නැගෙනහිර පළාත් සභා ලේකම් කාර්යාලයේ ලේකම්
V. නැගෙනහිර පළාත් ප්‍රධාන ලේකම් පර්ෂදයට අයත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්
VI. නැගෙනහිර පළාත් සභාවේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්
VII. නැගෙනහිර පළාතේ මහනගර සභා කොමසාරිස්වරුන්
VIII. නැගෙනහිර පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ ලේකම්
IX. නැගෙනහිර පළාත් ආණ්ඩුකාර ලේකම් කාර්යාලයේ සහකාර ලේකම්

**උපලේඛන 2**

(2) වර්ෂ 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32(1) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව හා වර්ෂ 1990 අංක 28 දරන පළාත් සභා (සංශෝධන) පනතේ 4 වන පරිච්ඡේදය මගින් සංශෝධිත උක්ත පනතේ 32(2අ) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව නැගෙනහිර පළාතේ ප්‍රධාන ලේකම්වරයාට සහ නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ අනෙකුත් නිලධාරීන්ට මින් ඉදිරියට පැහැදිළි කෙරෙන ආකාරයට නැවත බලතල පැවරීමට PPSC-EP වෙත මෙමගින් බලය පවරන අතර එම බලතල ක්‍රියාත්මක කිරීමේදී හෝ ඉටු කිරීමේදී සුදුසු පරිදි අදාළ සේවාවන්හි සේවා ව්‍යවස්ථා හෝ බඳවාගැනීමේ පටිපාටි (SOR), නැගෙනහිර පළාතට අදාළ කරගත හැකි ආයතන සංග්‍රහයේ නීති, කාර්ය පටිපාටික රීති හා චක්‍රලේඛවලට දැඩිව හා පූර්ණ අනුකූලතාවයෙන් යුතුව කටයුතු කළ යුතු බවට වන කොන්දේසිය යටතේ එසේ පළාත් ප්‍රධාන ලේකම්ට හා අනෙකුත් නිලධාරීන්ට පවරනු ලැබිය හැකිය. කෙසේ වෙතත් PPSC-EP පහත සඳහන් බලතල තමා වෙත රඳවා තබාගනු ඇත.

I. පළාත් රාජ්‍ය සේවයේ සියළු කාණ්ඩවලට බඳවාගැනීම.

II. මේ සමග අමුණා ඇති ඇමුණුම 1 හි 2 වන ඡේදය යටතේ කාණ්ඩගත කර ඇති දීප ව්‍යාප්ත සේවාවන්ට සමාන පළාත් මාණ්ඩලික නිලධාරීන් පත්කිරීම.

III. මේ සමග අමුණා ඇති ඇමුණුම 1 හි 4(ix) වන ඡේදය යටතේ කාණ්ඩගත කර ඇති පළාත් ඒකාබද්ධ සේවයේ විශේෂ ශ්‍රේණියේ හා අධි ශ්‍රේණියේ නිලධාරීන් පත්කිරීම, විනය පාලනය හා සේවයෙන් පහකිරීම.

IV. මේ සමග අමුණා ඇති ඇමුණුම 1 හි 5(i) වන ඡේදය යටතේ කාණ්ඩගත කර ඇති ගුරුවරුන් පත්කිරීම.

V. අදාළ බඳවාගැනීමේ පටිපාටි හෝ සේවා ව්‍යවස්ථා අනුව පත්වීම් බලධාරියා PPSC-EP වන තනතුරුවලට නිලධාරීන් පත්කිරීම.

VI. කොන්ත්‍රාත් හා නැවත සේවයේ යෙදවීමේ පදනමින් නිලධාරීන් පත්කිරීම.

VII. අදාළ බඳවාගැනීමේ පටිපාටි හෝ සේවා ව්‍යවස්ථාවන්ට අනුව ඔවුන්ගේ පත්වීම් බලධාරියා PPSC-EP වන තනතුරුවලට වැඩබැලීමේ හා රාජකාරි ඉටුකිරීමේ පදනමින් නිලධාරීන් පත්කිරීම.

VIII. සේවා ව්‍යවස්ථා හෝ බඳවාගැනීමේ පටිපාටි යටතේ උපලේඛනගත කර ඇති ඕනෑම තනතුරකට බඳවාගත යුතු නිලධාරීන් තෝරාගැනීම සඳහා අදාළ සේවා ව්‍යවස්ථා හෝ බඳවාගැනීමේ පටිපාටිවලට අනුව පැවැත්විය යුතු ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ, මා විසින් අනුමත කරන ලද ලකුණු පටිපාටිවලට අනුකූලව පැවැත්වීම.

IX. මේ සමග අමුණා ඇති ඇමුණුම I හි පළමුවන ඡේදය හැර අනෙකුත් ඡේද යටතේ කාණ්ඩගත කර ඇති පළාත් රාජ්‍ය සේවයේ සියළු නිලධාරීන් මාගේ එකඟතාවය සහිතව පළාත් රාජ්‍ය සේවයෙන් නිදහස් කිරීම.

කොන්ත්‍රාත් පත්වීම් හා නැවත සේවයේ යෙදවීම ඇතුළත්ව ඉහත සඳහන් බඳවාගැනීම්, නව පත්වීම් සියල්ලම මාගේ එකඟතාවය සහිතව පමණක් සිදුකළ යුතුය.

(3) වර්ෂ 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32(3) වගන්තිය යටතේ මා වෙත පවරන ලද බලතලවලට අනුව මා විසින් අන්‍යාකාරයකින් විධිවිධාන සලසන තෙක් හෝ තීරණය කරන තෙක් පහත සඳහන් පරිදි නියම කොට ප්‍රකාශ කරමි.

I. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය (කාණ්ඩ I හා II) හා එයට වරින් වර සිදුකරනු ලබන සංශෝධන නැගෙනහිර පළාත් සභාවේ සියළු නිලධාරීන් කෙරෙහි බලපැවැත්වේ.

II. මාගේ එකඟතාවය සහිතව PPSC-EP විසින් පළකරන ලද නැගෙනහිර පළාත් සභාවේ පළාත් රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීති සංග්‍රහය හා සියළු චක්‍රලේඛ නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ සියළු නිලධාරීන් කෙරෙහි බලපැවැත්වේ.

III. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පළකර ඇති කාර්ය පටිපාටික රීති හා එයට වරින් වර සිදුකරනු ලබන සංශෝධන නැගෙනහිර පළාතට අදාළ කරගැනීම සම්බන්ධයෙන් මාගේ එකඟතාවය ලබාගැනීමෙන් අනතුරුව නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ සියළු නිලධාරීන් කෙරෙහි බලපැවැත්වේ.

IV. රාජ්‍ය සේවා කොමිෂන් සභාව, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය, මුදල් අමාත්‍යාංශය හා අනෙකුත් රේඛීය අමාත්‍යාංශයන් විසින් රජයේ නිලධාරීන් පත්කිරීම, බඳවාගැනීම, ස්ථානමාරු කිරීම, විනය පාලනය හා සේවයෙන් පහකිරීම සම්බන්ධයෙන් පළකරනු ලබන චක්‍රලේඛ අදාළ පරිදි නැගෙනහිර පළාතට අදාළ කරගැනීම සඳහා අවස්ථානුකූලව PPSC-EP හෝ නැගෙනහිර පළාත් ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය ලැබීමෙන් පසුව මා විසින් එකඟතාවය ප්‍රකාශ කිරීමෙන් පසුව පමණක් නැගෙනහිර පළාත් රාජ්‍ය සේවය කෙරෙහි බලපැවැත්වේ.

(4) **(A) නැගෙනහිර පළාත් ප්‍රධාන ලේකම් වෙත පැවරිය යුතු බලතල**

I. මෙහි ඇමුණුම I හි 01 වන ඡේදය යටතේ කාණ්ඩගත කර ඇති, 1989.11.15 දිනැති හා 56/89 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා එහි සංශෝධිත 1993.04.23 දිනැති 56/89 (i) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 1995.11.21 දිනැති 56/89 (ii) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව පළාත් රාජ්‍ය සේවයට නිදහස් කරන ලද්දාවූ හෝ ද්විතීයනය කරන ලද්දාවූ, දීප ව්‍යාප්ත සේවාවන්හි නිලධාරීන් ස්ථානගත කිරීම, ස්ථානමාරු හා මූලික විමර්ශන සිදුකිරීම පිළිබඳ බලතල රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති හා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමත ස්ථානමාරු පටිපාටියට අනුව ක්‍රියාත්මක කළ යුතුය. කෙසේවුවද, මෙහි ඇමුණුම I හි ඡේද 01 හි (i), (ii), (vi) සහ (vii) යන වගන්ති යටතේ සඳහන් කර ඇති දීප ව්‍යාප්ත සේවාවන්හි නිලධාරීන් ස්ථානගත කිරීම හා ස්ථානමාරු අදාළ අමාත්‍යාංශ ලේකම්ගේ සහ/හෝ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්ගේ උපදෙස් අනුව මාගේ එකඟතාවය යටතේ සිදුකළ යුතුය.

II. මෙහි ඇමුණුම I හි ඡේද 01 යටතේ කාණ්ඩගත කර ඇති නැගෙනහිර පළාතේ සේවය කරන දීප ව්‍යාප්ත සේවාවන්හි නිලධාරීන් නිදහස් කිරීම පිළිබඳ බලතල මාගේ එකඟතාවය යටතේ ක්‍රියාත්මක කළ යුතුය.

III. මෙහි ඇමුණුම I හි ඡේද 02 යටතේ කාණ්ඩගත කර ඇති දීප ව්‍යාප්ත සේවාවන්ට සමාන පළාත් මාණ්ඩලික නිලධාරීන් ස්ථානගත කිරීම, ස්ථානමාරු කිරීම, විනය පාලනය හා සේවයෙන් පහකිරීම පිළිබඳ බලතල.

IV. ප්‍රධාන ලේකම්ගේ පරිපාලන විෂය පථය යටතට ගැනෙන මෙහි ඇමුණුම I හි ඡේද 05(vii) යටතේ කාණ්ඩගත කර ඇති ප්‍රාථමික ශ්‍රේණියේ සේවකයින් (දෙපාර්තමේන්තුගත සේවයේ) පත්කිරීම, ස්ථානමාරු කිරීම, විනය පාලනය හා සේවයෙන් පහකිරීම පිළිබඳ බලතල හා ඔවුන්ගේ බඳවාගැනීම් PPSC-EP හි අනුමැතිය යටතේ සිදුකළ යුතුය.

V. ප්‍රධාන ලේකම්ගේ පරිපාලන විෂය පථය යටතට ගැනෙන මෙහි ඇමුණුම I හි ඡේද 05(vii) යටතේ කාණ්ඩගත කර ඇති ප්‍රාථමික ශ්‍රේණියේ සේවකයින් (දෙපාර්තමේන්තුගත සේවයේ) අනියම් හෝ තාවකාලික පදනමින් පත්කිරීම පිළිබඳ බලතල මාගේ එකඟතාවය සහිතව ක්‍රියාත්මක කළ යුතුය.

**(B) නැගෙනහිර පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම්, පරිපාලන වෙත පැවරිය යුතු බලතල**

I. මෙහි ඇමුණුම I හි ඡේද 03 යටතේ කාණ්ඩගත කර ඇති පළාත් ඒකාබද්ධ සේවයේ නිලධාරීන් පත්කිරීම, ස්ථානගත කිරීම, ස්ථානමාරු කිරීම, උසස් කිරීම, විනය පාලනය හා සේවයෙන් පහකිරීම පිළිබඳ බලතල හා මෙහි ඇමුණුම I හි ඡේද 4(ix) යටතේ කාණ්ඩගත කර ඇති විශේෂ ශ්‍රේණියේ සහ අධි ශ්‍රේණියේ නිලධාරීන් පළාත් ඒකාබද්ධ සේවය තුළ ස්ථානගත කිරීම හා ස්ථානමාරු කිරීම පිළිබඳ බලතල ක්‍රියාත්මක කිරීමේ දී ප්‍රධාන ලේකම්, අදාළ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් හා අදාළ අමාත්‍යාංශ ලේකම් සමග සාකච්ඡා කර ක්‍රියාත්මක කළ යුතුය.

II. ඉහත කාණ්ඩවලට අනියම් හෝ තාවකාලික පදනමින් පත්කිරීම් සිදුකිරීමේදී PPSC-EP හි නිර්දේශය සහිතව මාගේ පූර්ව අනුමැතියට යටත්ව සිදුකළ යුතුය.

III. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පරිපාලන) ගේ පරිපාලන විෂය පථය යටතට ගැනෙන මෙහි ඇමුණුම I හි ඡේද 05(vii) යටතේ කාණ්ඩගත කර ඇති ප්‍රාථමික ශ්‍රේණියේ සේවකයින් (දෙපාර්තමේන්තුගත සේවයේ) අනියම් හෝ තාවකාලික පදනමින් පත්කිරීම පිළිබඳ බලතල මාගේ එකඟතාවයට යටත්ව ක්‍රියාත්මක කළ යුතුය.

**(C) පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්, නැගෙනහිර පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන්, සභා ලේකම්, නැගෙනහිර පළාත් ආණ්ඩුකාර ලේකම් හා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පරිපාලන) හැර අනෙකුත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් වෙත පැවරිය යුතු බලතල**

I. මෙහි ඇමුණුම I හි පරිච්ඡේද 01 (i), (ii), (vi) හා (vii) යටතේ කාණ්ඩගත කර ඇති නිලධාරීන් හැර දීප ව්‍යාප්ත සේවාවන්හි නිලධාරීන්ගේ බඳවාගැනීමේ පටිපාටි, සේවා ව්‍යවස්ථා හෝ ස්ථානමාරු පටිපාටි මගින් අන්‍යාකාරයකින් විශේෂයෙන් නියම කර නොමැති නම්, ඔවුන් තම පරිපාලන විෂය පථය ඇතුළත ස්ථානගත කිරීම හා ස්ථානමාරු කිරීම පිළිබඳ බලතල.

II. මෙහි ඇමුණුම I හි පරිච්ඡේද 04 යටතේ කාණ්ඩගත කර ඇති තම පරිපාලන විෂය පථය යටතට ගැනෙන පළාත් ඒකාබද්ධ සේවයට අයත් නොවන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන්ගේ බඳවාගැනීමේ පටිපාටි, සේවා ව්‍යවස්ථා හෝ ස්ථානමාරු පටිපාටි මගින් අන්‍යාකාරයකින් විශේෂයෙන් නියම කර නොමැති නම්, ඔවුන් පත්කිරීම, ස්ථානගත කිරීම, ස්ථානමාරු කිරීම, විනය පාලනය හා සේවයෙන් පහකිරීම පිළිබඳ බලතල.

III. නැගෙනහිර පළාත් අධ්‍යාපන විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් වෙත, මෙහි ඇමුණුම I හි පරිච්ඡේද 04(ii) යටතේ කාණ්ඩගත කර ඇති ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන්ගේ (Sri Lanka Principal Service) ස්ථානගත කිරීම, ස්ථානමාරු කිරීම, විනය පාලනය හා සේවයෙන් පහකිරීම පිළිබඳ බලතල සහ මෙහි ඇමුණුම I හි පරිච්ඡේද 05(i) යටතේ කාණ්ඩගත කර ඇති ශ්‍රී ලංකා ගුරු සේවයේ නිලධාරීන්ගේ (Sri Lanka Teachers' Service) ඔවුන්ගේ බඳවාගැනීමේ පටිපාටි, සේවා ව්‍යවස්ථා හෝ ස්ථානමාරු පටිපාටි මගින් අන්‍යාකාරයකින් විශේෂයෙන් නියම කර නොමැති නම් ඔවුන්ගේ විනය පාලනය හා සේවයෙන් පහකිරීම පිළිබඳ බලතල.

IV. නැගෙනහිර පළාත් සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් වෙත, මෙහි ඇමුණුම I හි පරිච්ඡේද 05(ii) යටතේ කාණ්ඩගත කර ඇති පළාත් මාණ්ඩලික ශ්‍රේණියට අයත් නොවන නිලධාරීන්ගේ (Non-Staff Grade Officers) බඳවාගැනීමේ පටිපාටි, සේවා ව්‍යවස්ථා හෝ ස්ථානමාරු පටිපාටි මගින් අන්‍යාකාරයකින් විශේෂයෙන් නියම කර නොමැති නම්, ඔවුන්ගේ විනය පාලනය හා සේවයෙන් පහකිරීම පිළිබඳ බලතල.

V. ඉහත 4 C (III) හා 4 C (IV) හි සඳහන් කාණ්ඩ හැර තම පරිපාලන විෂය පථයට යටත් මෙහි ඇමුණුම I හි පරිච්ඡේද 05 යටතේ කාණ්ඩගත කර ඇති පළාත් මාණ්ඩලික ශ්‍රේණියට අයත් නොවන නිලධාරීන්ගේ බඳවාගැනීමේ පටිපාටි, සේවා ව්‍යවස්ථා හෝ ස්ථානමාරු පටිපාටි මගින් අන්‍යාකාරයකින් විශේෂයෙන් නියම කර නොමැති නම්, ඔවුන් පත්කිරීම, ස්ථානගත කිරීම, ස්ථානමාරු කිරීම, විනය පාලනය හා සේවයෙන් පහකිරීම පිළිබඳ බලතල.

VI. අදාළ ලේකම්වරුන් හා නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්ගේ පරිපාලන විෂය පථය යටතට ගැනෙන මෙහි ඇමුණුම I හි පරිච්ඡේද 05(vii) යටතේ විස්තර කර ඇති ප්‍රාථමික ශ්‍රේණියේ සේවකයින් (දෙපාර්තමේන්තුගත සේවයේ) පත්කිරීම, ස්ථානමාරු, විනය පාලනය හා සේවයෙන් පහකිරීම පිළිබඳ බලතල. කෙසේවුවද, මෙම සේවා කාණ්ඩයට පත්කිරීම් සිදුකිරීමට පෙර PPSC-EP හි එකඟතාවය ලබාගත යුතුය.

VII. වෛද්‍ය හෝ සානුකම්පිත හේතු මත නිලධාරීන්ට මෙම පළාත තුළට හෝ මෙම පළාතෙන් පිටතට තාවකාලික ස්ථානමාරු ලබාදීම සිදුකළ යුත්තේ PPSC-EP හි නිර්දේශය ලබාගැනීමෙන් පසුව මාගේ අනුමැතියට යටත්ව ය.

සටහන : පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ සියළු විනය පාලන කටයුතු ඒ ඒ අවස්ථාවේදී PPSC-EP වෙත හා අදාළ පත්වීම් බලධාරියා හෝ විනය බලධාරියා වෙත දැන්විය යුතුය.

**(D)** පළාතේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත පැවරිය යුතු බලතල

I. මෙහි ඇමුණුම I හි පරිච්ඡේද 05(iv) සහ 5(vii) යටතේ කාණ්ඩගත කර ඇති මාණ්ඩලික ශ්‍රේණියේ නොවන දෙපාර්තමේන්තු සේවයේ නිලධාරීන් සහ ප්‍රාථමික ශ්‍රේණි සේවකයින්ගේ (දෙපාර්තමේන්තුගත සේවයේ) බඳවාගැනීමේ පටිපාටි, සේවා ව්‍යවස්ථා හෝ ස්ථානමාරු පටිපාටිවලින් අන්‍යාකාරයකින් නියම කර නොමැති නම් පමණක් පරිපාලන විෂය පථය තුළ ස්ථානමාරු කිරීම පිළිබඳ බලතල.

II. දෙපාර්තමේන්තුව යටතේ සේවය කරන නිලධාරීන්ට හෝ සේවකයින්ට සේවය හැරයාමේ නියෝග නිකුත් කිරීම හා ඔවුන්ගේ වැඩ තහනම් කිරීම සහ ආයතන සංග්‍රහයේ II වන වෙළුමෙහි සඳහන් වන පරිදි ඔවුනට සුළු දඬුවම් පැමිණවීම පිළිබඳ බලතල ඒ ඒ අවස්ථාවේදී PPSC-EP, අදාළ පත්වීම් බලධාරියා/විනය බලධාරියා දැනුවත් කළ යුතුය.

III. මෙහි ඇමුණුම I හි පරිච්ඡේද 05(i) යටතේ කාණ්ඩගත කර ඇති ගුරුවරුන් පළාත තුළ ස්ථානගත කිරීම හා ස්ථානමාරු කිරීම පිළිබඳ බලතල පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ එකඟතාවය සහිතව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ක්‍රියාත්මක කළ යුතුය.

IV. මෙහි ඇමුණුම I හි පරිච්ඡේද 05(ii) යටතේ කාණ්ඩගත කර ඇති නිලධාරීන් පළාත තුළ ස්ථානගත කිරීම හා ස්ථානමාරු කිරීම පිළිබඳ බලතල පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ එකඟතාවය සහිතව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් ක්‍රියාත්මක කළ යුතුය.

**(E)** පළාත් පාලන ආයතනවල පරිපාලන ප්‍රධානීන් වෙත පැවරිය යුතු බලතල

අදාළ පළාත් පාලන ආයතනයට අයත් උපලේඛනගත නොකළ (Unscheduled) තනතුරුවල සේවකයින් පත්කිරීම, බඳවාගැනීම, ස්ථානමාරු කිරීම, විනය පාලනය, වැඩ තහනම් කිරීම සහ සේවයෙන් පහකිරීම පිළිබඳ බලතල සහ තම පරිපාලන විෂය පථයට යටත් ඕනෑම නිලධාරියෙකු හෝ සේවකයෙකු සම්බන්ධයෙන් සේවය හැරයාමේ නියෝග නිකුත් කිරීම පිළිබඳ බලතල ක්‍රියාත්මක කිරීමේදී PPSC-EP, අදාළ අමාත්‍යාංශ ලේකම්, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් - පරිපාලන හා පළාත් පාලන කොමසාරිස්වරයාට ඒ ඒ අවස්ථාවේදී දැනුවත් කළ යුතුය.

**(F)** කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් ඇතුළුව ප්‍රාදේශීය ආයතන ප්‍රධානීන් වෙත පැවරිය යුතු බලතල

I. මෙහි ඇමුණුම් I හි පරිච්ඡේද 05(i) යටතේ කාණ්ඩගතකර ඇති ගුරුවරුන් අදාළ කලාපය තුළ පාසල් අතර ස්ථානමාරු කිරීම පිළිබඳ බලතල නැගෙනහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ එකඟතාවය සහිතව අදාළ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ක්‍රියාත්මක කළ යුතු ය.

II. තම පරිපාලන විෂය පථය යටතේ සේවය කරන නිලධාරීන්ට හෝ සේවකයින්ට සේවය හැරයාමේ නියෝග නිකුත් කිරීම පිළිබඳ බලතල ඒ ඒ අවස්ථාවේදී PPSC-EP, අදාළ පත්වීම් බලධාරීන්/විනය බලධාරීන් දැනුවත් කළ යුතුය.

III. PPSC-EP, අදාළ පත්වීම් බලධාරීන්/විනය බලධාරීන් ඒ ඒ අවස්ථාවේදී දැනුවත් කරමින් තම පරිපාලන විෂය පථය යටතේ සේවය කරන මෙහි ඇමුණුම් I හි පරිච්ඡේද 05(vii) යටතේ කාණ්ඩගතකර ඇති ප්‍රාථමික ශ්‍රේණියේ සේවකයින්ට (දෙපාර්තමේන්තුගත සේවයේ) ආයතන සංග්‍රහයේ දෙවන කාණ්ඩයෙහි සඳහන් සුළු දඬුවම් පැණවීම පිළිබඳ බලතල ක්‍රියාත්මක කළ යුතුය.

(5) මෙම බලතල පැවරීම සම්බන්ධයෙන් මා විසින් වරින් වර නිකුත් කරනු ලබන උපදෙස්වලට හා මගපෙන්වීම්වලට අනුව එසේ බලතල පවරන ලද බලධාරීන් විසින් අදාළ පරිදි ක්‍රියාත්මක කළ යුතුය.

(6) නැගෙනහිර පළාත් සභාවේ ඕනෑම නිලධාරියෙකු විසින් මෙසේ පවරන ලද බලතල යටතේ සේවා අවශ්‍යතාව මත නිලධාරීන් ස්ථානමාරු කිරීමට පෙර මාගේ එකඟතාවය ලබාගත යුතුය.

(7) අභියාචනා

(I) මෙසේ පවරන ලද බලතල යටතේ නැගෙනහිර පළාත් ප්‍රධාන ලේකම් හෝ නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ වෙනත් නිලධාරියෙකු විසින් ගන්නා ලද තීරණයකින් නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ යම් නිලධාරියෙකුට තමා අගතියට පත් වූ බව හැඟෙන්නේ නම් එම තීරණයට හෝ නියෝගයට එරෙහිව PPSC-EP වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය. එවැනි අභියාචනයක් ලද පසු එය සලකා බලා PPSC-EP විසින් නැගෙනහිර පළාත් ප්‍රධාන ලේකම් හෝ නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ අනෙකුත් නිලධාරියෙකු විසින් ගන්නා ලද එම තීරණය හෝ නියෝගය වර්ෂ 1990 අංක 28 දරන පනත මගින් සංශෝධිත වර්ෂ 1987 අංක 42 දරන පළාත් සභා පනතෙහි 32(2ආ) වගන්තිය යටතේ පවරන ලද බලතල යටතේ සංශෝධනය කිරීමට, වෙනස් කිරීමට හෝ ඉල්ලා අස්කර ගැනීමට හෝ නැවත පැනවීමට හැකිය.

(II) මෙසේ පවරන ලද බලතල යටතේ PPSC-EP, නැගෙනහිර පළාත් ප්‍රධාන ලේකම් හෝ නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ වෙනත් නිලධාරියෙකු විසින් ගන්නා ලද තීරණයකින් නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ යම් නිලධාරියෙකුට තමා අගතියට පත් වූ බව හැඟෙන්නේ නම් එම තීරණයට එරෙහිව මා වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය. එවැනි අභියාචනයක් ලද පසු මා විසින්, වර්ෂ 1990 අංක 28 දරන පනත මගින් සංශෝධිත වර්ෂ 1987 අංක 42 දරන පළාත් සභා පනතෙහි 33(8) වගන්තිය යටතේ මා සතු බලතල යටතේ නියෝගයක් නිකුත් කරනු ලැබේ.

(III) දීප ව්‍යාප්ත සේවාවන්හි නිලධාරීන්ගේ අභියාචනා 1989.11.15 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 56/89 අනුව හා එහි සංශෝධිත 1993.04.23 දිනැති හා අංක 56/89(i) හා 1995.11.21 දිනැති හා අංක 56/89(ii) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල සඳහන් විධිවිධානවලට අනුකූලව ඉදිරිපත් කළ යුතුය.

(8) පළාතෙන් පිටතට ස්ථානමාරු නියෝග ලද හෝ ස්ථානමාරු කළ යුතු නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයේ නිලධාරියෙකු නිදහස් කිරීම සම්බන්ධයෙන් අදාළ බලධාරියා විසින් PPSC-EP මගින් එම නිලධාරියා පළාතෙන් නිදහස් කිරීමට පෙර මා වෙතින් ලිඛිත පූර්ව අනුමැතිය ලබාගත යුතුය.

(9) මෙමගින් පවරන ලද බලතල නැගෙනහිර පළාත් සභාවේ පළාත් රාජ්‍ය සේවා නිලධාරීන් විසින් ක්‍රියාත්මක කිරීම, ක්‍රියාත්මක නොකිරීම හෝ බලතල උල්ලංඝනය කිරීම හෝ බලය අවභාවිතා කිරීම හේතුවෙන් නැගෙනහිර පළාත් සභාවට සිදුවන හානියක් හෝ අන් කිසිදු අලාභයක් සම්බන්ධයෙන් අදාළ පළාත් රාජ්‍ය සේවා නිලධාරියා වගකිව යුතුය.

(10) සේවා කාණ්ඩයන් හා නැගෙනහිර පළාත් සභාවේ ආයතන ප්‍රධානීන් විස්තර කෙරෙන ඇමුණුම් I හා II මේ සමග අමුණා ඇත.

(11) මෙම සංදේශය සම්බන්ධයෙන් යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත් ඒ පිළිබඳ මාගේ තීරණය අවසාන හා තීරණාත්මක වේ.

(12) මෙම ආණ්ඩුකාර සංදේශය 2026 ජනවාරි පළමුවන දින සිට බලාත්මක වන අතර 2011.09.08 දිනැති හා අංක 2011/08 දරන ආණ්ඩුකාර සංදේශය හා එහි පසුකාලීන සංශෝධනයන් වන 2013.08.29 දිනැති ආණ්ඩුකාර සංදේශ අංක 03/2013, 2014.07.16 දිනැති ආණ්ඩුකාර සංදේශ අංක 04/2014 සහ 2015.04.15 දිනැති ආණ්ඩුකාර සංදේශ අංක 01/2015, සහ බලතල පැවරීම සම්බන්ධයෙන් මෙයට පෙර පළකරන ලද සංශෝධන සියල්ලම, එම නියෝගයන් යටතේ ගන්නා ලද කිසිදු ක්‍රියාමාර්ගයකට අගතියක් නොවන පරිදි 2026 ජනවාරි පළමුවන දින සිට පරිච්ඡින්න කරනු ලැබේ.

(13) මෙම සංදේශයෙහි ඉංග්‍රීසි, සිංහල හා දෙමළ පාඨයන් සම්බන්ධයෙන් යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත් ඉංග්‍රීසි පාඨය බලපැවැත්වේ.

ආචාර්ය, **ජයන්ත ලාල් රත්නසේකර,**
නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවර.

2025 දෙසැම්බර් මස 22 වැනි දින.

ඇමුණුම I

**සේවා කාණ්ඩ**

**01. දීප ව්‍යාප්ත සේවා**

I. ශ්‍රී ලංකා පරිපාලන සේවය
II. ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය
III. ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය
IV. ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවය
V. ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවය
VI. ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය
VII. ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය
VIII. ශ්‍රි ලංකා අධ්‍යාපන පරිපාලන සේවය
IX. ශ්‍රී ලංකා ගෘහනිර්මාණ ශිල්පී සේවය
X. ශ්‍රී ලංකා විගණන සේවය
XI. ශ්‍රී ලංකා වෛද්‍ය නිලධාරි සේවය (විශේෂඥ සහ විශේෂඥ නොවන)
XII. ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය නිලධාරි සේවය
XIII. ශ්‍රී ලංකා මිනින්දෝරු සේවය
XIV. ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවය

**02. දීප ව්‍යාප්ත සේවාවන්ට සමාන පළාත් මාණ්ඩලික නිලධාරීන්**

I. පළාත් ගණකාධිකාරීන්
II. පළාත් ක්‍රමසම්පාදන නිලධාරීන්
III. පළාත් ඉංජිනේරුවන්
IV. පළාත් කෘෂිකර්ම නිලධාරීන්
V. පළාත් සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්වරුන්
VI. පළාත් ඉඩම් සහකාර කොමසාරිස්වරුන්
VII. පළාත් පාලන සහකාර කොමසාරිස්වරුන්
VIII. සහකාර ආදායම් කොමසාරිස්වරුන්
IX. පළාත් නීති නිලධාරීන්
X. පළාත් බදු තක්සේරුකරුවන්
XI. ප්‍රමාණ සමීක්ෂකවරුන්
XII. සංඛ්‍යාලේඛනඥයන්

**03. පළාත් ඒකාබද්ධ සේවය**

I. පළාත් භාෂා පරිවර්තක සේවය (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 හි පරිච්ඡේද II අනුව මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන්)
II. පළාත් සංවර්ධන නිලධාරී සේවය
III. තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ නිලධාරීන් (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 හි පරිච්ඡේද II අනුව මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන්) හා තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ සහකාරවරුන්
IV. ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවය (සිවිල්/කාර්මික/සැලසුම් ශිල්පී/ප්‍රමාණ සමීක්ෂක)
V. පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවය
VI. පළාත් රියදුරු සේවය
VII. කාර්යාල කාර්ය සහායක සේවය

**04. පළාත් මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන් (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 හි II වන පරිච්ඡේදයට අනුකූල නමුත් දීප ව්‍යාප්ත සේවාවන්ට අයත් නොවන තනතුරු)**

I. ක්ෂේත්‍ර නිලධාරීන් - මාණ්ඩලික ශ්‍රේණිය
II. ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන්
III. හෙද සේවයේ, පරිපූරක වෛද්‍ය සේවා හා අතුරු වෛද්‍ය සේවාවන්හි විශේෂ ශ්‍රේණිය
IV. ලියාපදිංචි වෛද්‍ය නිලධාරීන්/සහකාර වෛද්‍ය නිලධාරීන්
V. සැලසුම් හා ක්‍රියාත්මක කිරීමේ නිලධාරීන්
VI. පද්ධති පරිපාලකයින්/වැඩසටහන් සැකසුම්කරු - මාණ්ඩලික ශ්‍රේණිය
VII. බඳු නිලධාරි
VIII. ඒකාබද්ධ සේවාවේ තනතුරු හැර අධීක්ෂණ කළමනාකරණ සහකාර (තාක්ෂණ) සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරීන්
IX. ඒකාබද්ධ සේවයේ විශේෂ ශ්‍රේණියේ හා අධි ශ්‍රේණියේ නිලධාරීන්
X. (දෙපාර්තමේන්තුගත සේවයේ) මාණ්ඩලික ශ්‍රේණියේ දෙපාර්තමේන්තුගත නිලධාරීන්

**05. පළාත් මාණ්ඩලික ශ්‍රේණියේ නොවන නිලධාරීන් (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 හි II වන පරිච්ඡේදයට අනුව නමුත් පළාත් ඒකාබද්ධ සේවාවන්ට අයත් නොවන තනතුරු)**

I. ශ්‍රී ලංකා ගුරු සේවය
II. හෙදියන්, පරිපූරක වෛද්‍ය සේවා, අතුරු වෛද්‍ය සේවා හා මෙම සේවාවන්හි විශේෂ ශ්‍රේණිය හැර අනෙකුත් නිලධාරීන්
III. ඒකාබද්ධ සේවයේ නොවන කළමනාකරණ සහකාර (තාක්ෂණික) හා අධීක්ෂණ කළමනාකරණ සහකාර (තාක්ෂණික) සේවයේ නිලධාරීන්
IV. මාණ්ඩලික ශ්‍රේණියේ නොවන දෙපාර්තමේන්තු සේවයේ (දෙපාර්තමේන්තුගත සේවය) නිලධාරීන්
V. වෛද්‍ය ලේඛන සහකාරවරුන්
VI. පළාත් පාලන සහකාරවරුන්
VII. ප්‍රාථමික ශ්‍රේණියේ සේවකයින් (දෙපාර්තමේන්තුගත සේවය)

ආචාර්ය, **ජයන්ත ලාල් රත්නසේකර**
නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවර

2025 දෙසැම්බර් මස 22 වැනි දින.

ඇමුණුම II

### දෙපාර්තමේන්තු ප්‍රධානීන්

| අංශය | | පරිපාලන විෂය පථය යටතේ ඇති ආයතනය/ආයතන | ආයතන ප්‍රධානියා |
|---|---|---|---|
| 1. නැගෙනහිර පළාත් ආණ්ඩුකාර පර්ෂදය | | | |
| | (1) | ආණ්ඩුකාර ලේකම් කාර්යාලය | ලේකම් |
| | (2) | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව | ලේකම් |
| | (3) | සභා ලේකම් කාර්යාලය | ලේකම් |
| 2. නැගෙනහිර පළාත් ප්‍රධාන ලේකම් පර්ෂදය | | | |
| | (1) | ප්‍රධාන ලේකම් කාර්යාලය | ප්‍රධාන ලේකම් |
| | (2) | පළාත් ආදායම් දෙපාර්තමේන්තුව | පළාත් ආදායම් කොමසාරිස් |
| | (3) | පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව | ප්‍රධාන අභ්‍යන්තර විගණක |
| | (4) | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් කාර්යාලය - පරිපාලන | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් - පරිපාලන |
| | (5) | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් කාර්යාලය - මුදල් | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් - මුදල් |
| | (6) | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් කාර්යාලය - සැලසුම් | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් - සැලසුම් |
| | (7) | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් කාර්යාලය - ඉංජිනේරු සේවා | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් - ඉංජිනේරු සේවා |
| | (8) | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් කාර්යාලය - පිරිස් හා පුහුණු | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් - පිරිස් හා පුහුණු |
| | (9) | කළමනාකරණ අභිවෘද්ධි පුහුණු ආයතනය | පළාත් කළමනාකරණ අභිවෘද්ධි පුහුණු අධ්‍යක්ෂ |
| | (10) | නීති අංශය | ප්‍රධාන නීති නිලධාරි |
| | (11) | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | පළාත් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් |
| 3. ප්‍රධාන අමාත්‍යාංශය හා මූල්‍ය හා සැලසුම්, නීතිය හා සාමය, පළාත් පාලන සහ අභ්‍යන්තර පරිපාලන, ග්‍රාමීය සංවර්ධන, ග්‍රාමීය කර්මාන්ත, සංචාරක හා පරිසර අමාත්‍යාංශය, නැගෙනහිර පළාත | | | |
| | (1) | ප්‍රධාන අමාත්‍යාංශය | ලේකම් |
| | (2) | පළාත් පාලන දෙපාර්තමේන්තුව | පළාත් පාලන කොමසාරිස් |
| | (3) | ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව | පළාත් ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ |
| | (4) | ග්‍රාමීය කර්මාන්ත දෙපාර්තමේන්තුව | පළාත් ග්‍රාමීය කර්මාන්ත අධ්‍යක්ෂ |
| | (5) | සංචාරක කාර්යාංශය | සාමාන්‍යාධිකාරී, සංචාරක කාර්යාංශය |
| 4. කෘෂිකර්ම, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය, සමුපකාර සංවර්ධන, ඉඩම් හා ඉඩම් පරිපාලන, ධීවර, ආහාර සැපයුම් හා බෙදාහැරීම් පිළිබඳ අමාත්‍යාංශය, නැගෙනහිර පළාත | | | |
| | (1) | කෘෂිකර්ම අමාත්‍යාංශය | ලේකම් |
| | (2) | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ |
| | (3) | සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ |
| | (4) | සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව | පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් |
| | (5) | ඉඩම් පරිපාලන දෙපාර්තමේන්තුව | පළාත් ඉඩම් කොමසාරිස් |
| | (6) | සමුපකාර සේවක කොමිෂන් සභාව | ලේකම්, සමුපකාර සේවක කොමිෂන් සභාව |
| | (7) | ධීවර අංශය | පළාත් ධීවර අධ්‍යක්ෂ |

| | | | |
|---|---|---|---|
| 5. | අධ්‍යාපන, ක්‍රීඩා, සංස්කෘතික කටයුතු, පෙර පාසල් අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ අධ්‍යාපන, යෞවන කටයුතු, පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීම්, නිපුණතා හා මිනිස් බල අමාත්‍යාංශය, නැගෙනහිර පළාත | | |
| | (1) | අධ්‍යාපන අමාත්‍යාංශය | ලේකම් |
| | (2) | අධ්‍යාපන දෙපාර්තමේන්තුව | පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ |
| | (3) | ක්‍රීඩා දෙපාර්තමේන්තුව | පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ |
| | (4) | සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | පළාත් සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ |
| | (5) | පෙර පාසල් අධ්‍යාපන කාර්යාංශය | සාමාන්‍යාධිකාරී, පෙර පාසල් අධ්‍යාපන කාර්යාංශය |
| 6. | මාර්ග සංවර්ධන, වාරිමාර්ග, ප්‍රවාහන, ගොඩනැගිලි හා ඉදිකිරීම්, නිවාස, ග්‍රාමීය විදුලි සැපයුම් හා ජල සැපයුම් අමාත්‍යාංශය, නැගෙනහිර පළාත | | |
| | (1) | මාර්ග සංවර්ධන අමාත්‍යාංශය | ලේකම් |
| | (2) | මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව | පළාත් මාර්ග සංවර්ධන අධ්‍යක්ෂ |
| | (3) | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂ |
| | (4) | ගොඩනැගිලි දෙපාර්තමේන්තුව | පළාත් ගොඩනැගිලි අධ්‍යක්ෂ |
| | (5) | මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය | මාර්ගස්ථ මගී ප්‍රවාහන අධ්‍යක්ෂ ජනරාල් |
| | (6) | නිවාස අධිකාරිය | සාමාන්‍යාධිකාරී, නිවාස අධිකාරිය |
| 7. | සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා ළමාරක්ෂක සේවා, සමාජ සුබසාධන හා වනිතා කටයුතු අමාත්‍යාංශය, නැගෙනහිර පළාත | | |
| | (1) | සෞඛ්‍ය අමාත්‍යාංශය | ලේකම් |
| | (2) | සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව | පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ |
| | (3) | දේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුව | පළාත් දේශීය වෛද්‍ය කොමසාරිස් |
| | (4) | පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව | පළාත් පරිවාස කොමසාරිස් |
| | (5) | සමාජ සේවා දෙපාර්තමේන්තුව | පළාත් සමාජ සේවා අධ්‍යක්ෂ |

ආචාර්ය, **ජයන්ත ලාල් රත්නසේකර,**
නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවර.

2025 දෙසැම්බර් මස 22 වැනි දින.

EOG 12 - 0224